**ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතිය - 2019**

---

ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමණාකරණ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 සැප්තැම්බර් 29 දින එළඹී අංක 5788 - එස්ආර්අයිඑල්කේ දරණ ණය ගිවිසුමේ පොදු කොන්දේසිවල ඇතුලත් II බී (3) වගන්තිය සහ 4.09 (බී) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. . පාර්ලිමේන්තුවට වාර්තාකල යුතු යැයි සැලකෙන මාගේ අදහස් දැක්වීම් හා නිරීකෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වත්කම් කළමනාකරණය පිළිබඳ මාර්ග සංවර්ධන අධිකාරියේ ධාරිතාව ශක්තිමත් කිරීම සහ නිර්මානකරණය, ඉදිකිරීම, නඩත්තුව හා ක්‍රියාත්මකකිරීම යන කරුණු නිසි ක්‍රම වේදයකින් යුතුව භාවිතාකර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම්කරගත් කොන්ත්‍රාත් ක්‍රම භාවිතයෙන් සකසන ලද ආකෘතියක් (OPBRC) යටතේ පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා කි.මී. 58 කින් යුත් (කොටසක්) නියමුකරණය කිරීමයි. අංක 5788 දරන ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය වි.ගැ.හි මිලියන 90.5 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 125 ක් හෙවත් රු.මිලියන 18,125 ක් වූ අතර සම්පූර්ණ වටිනාකමම මූල්‍යයනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟවී තිබුණි. කෙසේවෙතත්, 2018 අගෝස්තු 15 දිනැති අංක 18/1682/805/051 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, ව්‍යාපෘතියේ මූලික විෂය පථය වෙනස්කර තිබුණි. ඒ අනුව, මූලික ණය ප්‍රතිපාදනයෙන් රු. මිලියන 14,500 කට සමාන එ.ජ ඩොලර් මිලියන 100 ක් ව්‍යාපෘතියෙන් ඉවත්කර, සියළුම පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, පළාත් පාලන හා ක්‍රීඩා අමාත්‍යාංශයට වෙන්කර දී තිබුණි. ඉතිරි ශේෂයෙන්, ව්‍යාපෘතියේ කටයුතු කරගෙනයාම සඳහා එ.ජ.ඩොලර් මිලියන 16 කට සමාන රු. මිලියන 2,320 කට වෙන්කර තිබු අතර ඉතිරි වූ මුදල එ.ජ.ඩොලර් මිලියන 8.5 කට සමාන රු.මිලියන 1,232.5 ක් මාර්ග නඩත්තු භාර අරමුදලට මාරු කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 ජූනි 30 දින ආරම්භ කර 2018 අගෝස්තු 15 දින ප්‍රතිව්‍යුහගත කර තිබුණු අතර 2023 මාර්තු 31 වන විට නිමකිරීමට අපේක්ෂිතය.

**1.3 මතය**

---

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්

තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය හා කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-----------------------------------------**

**2.1** **ගිණුම්කරණ අඩුපාඩු**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 5 හි අංක 31 ඡේදය ප්‍රකාරව, මූල්‍ය අයිතම නිරවුල් කිරිම මත පැන නගින විනිමය අනුපාත වෙනස්කම් ඒවා පැන නගින කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන මගින් හඳුනාගත යුතුය. කෙසේවුවද, මහ බැංකුවේ විශේෂ (ඩොලර්) ගිණුමෙන් පැන නැගුන රු.මිලියන 1.96, ක් වූ විනිමය අලාභ ව්‍යාපෘති පිරිවැයක් ලෙස හෙළිදරව් කිරීමකින් තොරව ණය මුදලට එරෙහිව කපා හැර තිබුණි. | 1.96 | ගිණුම්කරණ ප්‍රමිතිය වැරදි ආකාරයට යොදා ගැනීම. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙවැනි ආකාරයේ දෝෂ නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 ට අනුකූල වීමට පියවර ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ මුළු පිරිවැය එ.ජ ඩොලර් මිලියන 16 ක් වුවද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි ව්‍යාපෘති 03 ක මුළු පිරිවැය සැලකිල්ලට ගනිමින් කාර්ය මණ්ඩලය සඳහා ව්‍යාපෘති දීමනාව ගණනය කර ඇති අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ අනෙකුත් ව්‍යාපෘති සඳහා ඒවා වෙන්කර දැක්වීමකින් තොරව ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියට පමණක් අය කර තිබුණි. | 1.24 | ව්‍යාපෘතියේ කාර්යමණ්ඩල පිරිවැය වැඩියෙන් දැක්වීම. | මහාමාර්ග හා මාර්ග සංවර්ධන හා ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය යටතේ ව්‍යාපෘති 03 ක් ඇතුලත් කිරීමටත්, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය "ජාල සම්බන්ධතා වැඩිදියුණු කිරිම සහ | ව්‍යාපෘති දීමනාව ව්‍යාපෘති 3 අතර වෙන් කිරීමට පියවර ගත යුතුය. |

වත්කම්
කළමනාකරණ
ව්‍යාපෘතිය" ලෙස නම්
කිරීමටත් තීරණය
කරන ලදී.

## 03. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

| අංකය | සංරචකය/උප සංරචකය | 2019 දෙසැම්බර් 31 දිනට | | | | ප්‍රමාදය/විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර |
|---|---|---|---|---|---|---|---|---|
| | | අපේක්ෂිත භෞතික කාර්ය සාධනය | ලඟාකරගත් කාර්ය සාධනය | අපේක්ෂිත මූල්‍ය කාර්ය සාධනය (රු.මිලියන) | ලඟාකරගත් මූල්‍ය කාර්ය සාධනය | | | |
| (අ) | වත්කම් කළමනාකරණ සහාය | 10% | වාර්තා කර නැත | 100 | වාර්තා කර නැත | 2019 ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 5 ක් ලඟාකර ගැනීම සඳහා වර්ෂය තුළ රු.මිලියන 376 ක් වැය කිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේවුවද, ක්‍රියාකාරි සැලැස්මේ දක්වා ඇති ප්‍රධාන අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ව්‍යාපෘතිය පියවර ගෙන නොතිබූ අතර ශ්‍රී ලංකා මාර්ග ප්‍රවේශ කළමනාකරණ පද්ධතියේ (SLRAMS) සහ මාර්ග සංවර්ධන අධිකාරියේ බහු ක්‍රියාකාරි ජාල සමීක්ෂණ වාහනය (MFNSV) නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම සඳහා මිලියන 43.67 ක්, දේශීය හා විදේශීය පුහුණුවීම් | ව්‍යාපෘතියේ වැඩ විෂය පථය ප්‍රමාදයක් සහිතව සම්පූර්ණ කිරීමට සහ ව්‍යාපෘති පිරිවැය ඉහළ යාමට හැකියාවක් පවතී. | 2018 දී ව්‍යාපෘතියේ විෂය පථය වෙනස්වීම හේතුවෙන්, 2019 වර්ෂයේදී රු.මිලියන 79.21 ක සත්‍ය පිරිවැයක් දැරූ අතර ඉන් මිලියන 33.39 ක් පුනරාවර්තන වියදම් සඳහාද මිලියන 43.67 ක් වත්කම් කළමනාකරණ ඒකකය සඳහාද මිලියන 2.14 ක් දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහාද වැයකර තිබුණි. ප්‍රසම්පාදන සැලැස්මේ ඇතැම් ක්‍රියාකාරකම් ළගා කර නොගැනීමට |
| (ආ) | ධාරිතා වර්ධනය සහ පුහුණුව | 3% | වාර්තා කර නැත | 8 | වාර්තා කර නැත | | | |
| (ඇ) | වර්ධක මෙහෙයුම් පිරිවැය | 28% | 3% | 82 | වාර්තා කර නැත | | | |
| (ඈ) | උපකරණ මිලදී ගැනීම | 80% | වාර්තා කර නැත | 174 | වාර්තා කර නැත | | | |
| (ඉ) | උපදේශනය | 3% | වාර්තා කර නැත | 12 | වාර්තා කර නැත | | | |

| | | | |
|---|---|---|---|
| | | සඳහා රු.මිලියන 2.14 ක් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම් සඳහා රු.මිලියන 33.39 ක්ද වැය කර තිබුණි. තවද, ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 135.8 ක් වන ප්‍රසම්පාදන සැලැස්මේ පැවති අයිතම 09 කට අදාලව, 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතිය විසින් ළඟාකරගෙන තිබූ ප්‍රගතිය සියයට 3 ක් පමණක් වන බව නිරීක්ෂණය විය. | හේතුව පැහැදිලි කර ඇත. |

**විගණකගේ නිර්දේශය** - වත්කම් කළමනාකරණ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනාගෙන ඉලක්කගත කාලසීමාව තුළ අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා අදාල සැලැස්ම සකස් කල යුතුය.

## 3.2 ඌන උපයෝජිත වත්කම්

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රු.මිලියන 169.78 ක් වන මුළු නොනිමි වැඩවලින් රු.මිලියන 90.57 ක් සංකල්පීය සැලසුම් , භූ විෂමතා සමීක්ෂණය, සංවර්ධන පර්යේෂණ උපදේශන ආයතනය (IDRC) සඳහා පරිශීලක තෘප්තිමත් සමීක්ෂණය, පර්යේෂණ සංවර්ධන උපදේශනය - සමාජ බලපෑම් වාර්තාව/ නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම, (RDA-SIA/RAP), ඉඩම් අත්පත්කරගැනීමේ සමීක්ෂණය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම් ආදිය සඳහා ව්‍යාපෘතිය විසින් වැයකර තිබුණි. කෙසේවුවද, 2018 අගෝස්තු 15 දින ව්‍යාපෘතියේ | 2018 අගෝස්තු 15 වන දින කොන්ත්‍රාත්තුව අතහැර, ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීම හේතුවෙන් ජා-ඇල සිට පුත්තලම පාරේ මූලික කටයුතු සඳහා ව්‍යාපෘතියෙන් දරන ලද රු.මිලියන 90.57 ක මුදල නිශ්ඵල වී ඇති බව නිරීක්ෂණය විය. | අදහස පිළිගනිමි.<br>කෙසේවුවද, ප්‍රවාහන සම්බන්ධතා හා වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය විසින් නිර්මාණකරනය,ඉදිකිරීම,නඩත්තුව හා ක්‍රියාත්මකකිරීම යන කරුණු භාවිතාකර නිමැවුම් සහ කාර්ය සාධනය පදනම්කරගත් කොන්ත්‍රාත් ආකෘතිය (OPBRC) සඳහා සකස් කරන ලද ලංසු ලේඛන ප්‍රථම වතාවට (අයි) මාර්ග | අලාභය අවම කිරීම සඳහා පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | විෂය පථය ප්‍රතිව්‍යුහගත කිරිමේ රජයේ තීරණයේ ප්‍රතිඵලයක් ලෙස මූලික ව්‍යාපෘතියක් වන පැලියගොඩ - පුත්තලම මාර්ගයේ ජා-ඇල සිට හලාවත දක්වා වන මාර්ගයේ ඉදිකිරීම් අත්හැරීම හේතුවෙන් ඉහත ක්‍රියාකාරකම් සඳහා ගෙවීම් නිෂ්ඵල විය. | | ව්‍යාපෘතියේ මාර්ග පුනරුත්ථාපන කොන්ත්‍රාත්තුව සඳහා භාවිතා කර ඇත. | |
| (ආ) | 2019 වර්ෂය සඳහා භාණ්ඩාගාරය විසින් විදේශ ණය සහ ශ්‍රී ලංකා රජයේ වියදම් උපයෝජනය සඳහා ව්‍යාපෘතිය වෙත රු.මිලියන 312 ක් සහ රු.මිලියන 60 ක් වෙන්කර ඇත. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දින විට ව්‍යාපෘතිය, විදේශීය ණය ප්‍රතිපාදනයෙන් සියයට 16.98 ක් නියෝජනය කරන රු.මිලියන 52.99 ක් සහ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන වලින් සියයට 28.22 ක් නියෝජනය කරන රු.මිලියන 16.39 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ කටයුතුවල මන්දගාමී ප්‍රගතිය හේතුවෙන් විශේෂ (ඩොලර්) ගිණුමේ රු.මිලියන 195 ක මුදලක් වර්ෂයක් මුළුල්ලේ වැය නොකර තිබූ බව නිරීක්ෂණය විය. | ණය ලැබීම් රු.මිලියන 195 ක් වසරකට වඩා අක්‍රියව පැවතුණි. | ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විෂය පථය වෙනස් වීම හේතුවෙන් විශේෂ (ඩොලර්) ගිණුමේ ඉතිරි මුදල රු. මිලියන 195 ක් වැය නොකර පැවතුණි. | අරමුදල් භාවිතා කිරීමේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා ව්‍යාපෘතියේ කටයුතු නිසි ලෙස සැලසුම් කල යුතුය. |

3.3 මානව සම්පත් කළමනාකරණයට අදාල ගැටළු

| | විගණන නිරීක්‍ෂණ | බලපෑම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ව්‍යාපෘති කටුයුතු සඳහා කාර්යමණ්ඩලයට 49 දෙනෙකු බඳවාගැනීම සඳහා ව්‍යාපෘතිය විසින්, 2015 අප්‍රේල් 10 , 2017 නොවැම්බර් 16, 2019 ජුලි 25 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන තිබුණි. කෙසේවෙතත්, මෙම ව්‍යාපෘතිය සඳහා කාර්යමණ්ඩලය 14 දෙනෙකු බඳවාගෙන ඇති අතර, ප්‍රසම්පාදන විශේෂඥවරයකු , ජ්‍යේෂ්ඨ ඉංජිනේරුවරු 4 ක්, ඉංජිනේරුවරු 2 ක්, ප්‍රවාහන පද්ධති විශ්ලේෂකවරු 2 ක් , තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරින් 2 ක් , ජ්‍යේෂ්ඨ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරිවරයෙකු, භූ තොරතුරු තාක්‍ෂණ විශ්ලේෂකවරයෙකු, ක්‍ෂේත්‍ර නිලධාරින් 6 දෙනෙකු සහ රූප විශ්ලේෂකවරු 9 දෙනෙකු ඇතුළුව පුරප්පාඩු 35 ක් පිරවීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් අවශ්‍යය පියවර ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රමාද විය හැකිය. | 2018 මාර්තු 15 වන දින සේවක මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ව්‍යාපෘති කලමනාකරණ ඒකකය, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගෙන් ඉල්ලා සිටි අතර මෙම ඉල්ලීම, ඉල්ලීම් කල දින සිට මාස 7 කට පසුව එනම් 2018 ඔක්තෝම්බර් 26 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමුකරන ලදී. ප්‍රතිව්‍යුහගත කිරිම අවසන් වන තෙක් මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත සේවක යෝජනා යැවීම ප්‍රමාද කරන ලදී. | ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම සඳහා සුදුසුකම්ලත් කාර්යමණ්ඩලයක් බඳවා ගැනීමට පියවර ගත යුතුය. |